# 16.1 දිගුකාලීන තීරණ ගැනීමේ ක්‍රියාවලිය සැලසුම් කරයි.

## දිගුකාලීන තීරණ

ඉදිරි වර්ෂ කිහිපයකදී ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂාවෙන් ව්‍යාපාරයේ අරමුදල් යෙදවීම සම්බන්ධ තීරණ දිගුකාලීන තීරණ ලෙස හැඳින් වේ.

*උදා: කම්හලක් ඉදිකිරීම නිසා අනාගත වර්ෂ ගණනාවක් තුල නිෂ්පාදනය කළ හැකි වීම.*

## දිගුකාලීන තීරණවල ලක්ෂණ

- යෙදීමට අපේක්ෂිත අරමුදල විශාල වටිනාකමකින් යුක්ත වීම.
- දිගුකාලීන නිසා අවදානමක් තිබීම.
- දිගුකාලීනව ගන්නා තීරණ වෙනස් කළ නොහැකි වීම.
- දිගුකාලයක් පුරා ආයෝජිත මුදල රැඳී තිබීම.
- ඇගයීමක් කර තීරණය ගැනීම.

## දිගුකාලීන තීරණ ගැනීමේ ක්‍රියාවලිය

මෙහිදී අනුගමනය කළ යුතු පියවර කිහිපයකි.

**01.** විකල්ප ආයෝජන හඳුනා ගැනීම.
**02.** විකල්ප ආයෝජන සඳහා මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කිරීම.
**03.** විකල්ප ආයෝජන ඇගයීම.
**04.** සුදුසු ව්‍යාපෘතිය තෝරා ගැනීම හා ක්‍රියාත්මක කිරීම.

## මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කිරීම.

ආයෝජනයක ආරම්භක අවස්ථාවේ සිට අවසානය දක්වා වූ මුදල් ගලා ඒම හා මුදල් ගලා යෑම් මුදල් ප්‍රවාහ ලෙස හැඳින්වේ. මෙම මුදල් ප්‍රවාහ පුරෝකතනය කළ යුතුය. එය මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කිරීම ලෙස හැඳින්වේ.

## මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කිරීමේ ප්‍රධාන අවස්ථා

**01.** මූලික ආයෝජන අවස්ථාවේ මුදල් ප්‍රවාහ
**02.** වාර්ෂික මෙහෙයුම් මුදල් ප්‍රවාහ
**03.** පර්යන්ත මුදල් ප්‍රවාහ (අවසාන අවස්ථාවේ)

## මූලික ආයෝජනයේ මුදල් ප්‍රවාහ

| | රු. | රු. |
|---|---|---|
| නව වත්කම (ආයෝජනය) මිලට ගැනුම් පිරිවැය (බදු සහිතව) | | ××× |
| (+) ව්‍යාපාර ස්ථානයට ගෙන ඒමේ හා සවි කිරීමේ පිරිවැය | | ××× |
| ආරම්භක අවස්ථාවේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතාව | | ××× |
| | | ××× |
| (–) පවතින වත්කම් විකිණීමෙන් ලැබෙන මුදල් | ××× | |
| වත්කම් විකිණීමේදී ගෙවිය යුතු බදු | (××) | (×××) |
| මූලික ආයෝජනයේ ශුද්ධ මුදල් ප්‍රවාහය | | ××× |

*අභ්‍යාස*

| | රු. |
|---|---|
| පවතින යන්ත්‍රයේ පිරිවැය | 250 000 |
| නව යන්ත්‍රයේ ගැනුම් මිල | 500 000 |
| පැරණි යන්ත්‍රයේ අපේක්ෂිත විකුණුම් මිල | 100 000 |
| පැරණි යන්ත්‍රයේ විකුණුම් මුදල මත ගෙවිය යුතු බදු | 20 000 |
| නව කාරක ප්‍රාග්ධන අවශ්‍යතාව | 75 000 |
| නව යන්ත්‍රය ස්ථාපිත කිරීමේ වියදම | 50 000 |

***අවශ්‍ය වන්නේ***

**01.** මූලික ආයෝජනයේ මුදල් ගලා යෑම් හා මුදල් ගලා ඒම් වලට අදාළ මුදල් ප්‍රවාහ ගණනය කිරීම.
**02.** මූලික ආයෝජනයේ ශුද්ධ මුදල් ප්‍රවාහය ගණනය කිරීම.

**එල්.කේ. කපිල ධර්මසේන**
ර/උඩුමත්ත මිහිඳු මහා විද්‍යාලය, ඇහැලියගොඩ